# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ 16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 APRIL Issue No. 05


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 148:7-14)**

07. මහා සර්පයන් හා ගැඹුරු තැන් සියල්ලෙනි,

08. ගිනි සහ ගල් වර්ෂාවෙනි, හිම සහ වාෂ්පයෙනි, උන්වහන්සේගේ ආඥාව ඉෂ්ටකරන මාරුතයෙනි,

09. කඳු හා හෙල් සියල්ලෙනි, එල දෙන ගස් හා කිහිරි වෘක්ෂ සියල්ලෙනි,

10. තිරිසනුන් හා සියලු සිව්පාවෙනි, උරගයන් හා පියාඹන පක්ෂීනි,

11. පොළොවේ රජුන් හා සියලු මනුෂ්‍ය වර්ගයෙනි, අධිපතීන් හා පොළොවේ සියලු විනිශ්චයකාරයෙනි,.

12. තරුණයන් හා තරුණියෙනි, මහල්ලන් හා බාලයෙනි, පොළොවේ සිට ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

13. මොව්හු ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසාකෙරෙත්වා, මක්නිසාද උන්වහන්සේගේ නාමය පමණක් උසස්ය. උන්වහන්සේගේ මහිමය ස්වර්ගය හා පොළොව මත්තෙහි පවත්නේය.

14. උන්වහන්සේ ස්වකීය සෙනඟගේ අඟ එසෙවූසේක, ස්වකීය සියලු ශුද්ධවන්තයන්ට එනම් තමන්ට ළංව සිටින සෙනඟක් වන ඉශ්‍රායෙල් පුත්‍රයන්ට, ප්‍රශංසා හේතුවක් නැගූසේක. ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

## දෙවියන්වහන්සේගේ නිහඬතාවය ඔබ වෙනුවෙන් ක්‍රියා කරයි. !

**GOD IS WORKING FOR YOU THROUGH HIS SILENCE!**

*Sis. Angeline*



මගේ පුද්ගලික ජීවිතයේ ස්වාමීන් වහන්සේ පමණ කතා කරමින් ක්‍රියා කරන ආකාරය ගැන ඔබ හා සමග බෙදා ගැනීමට හැකිවීම ගැන මා ඉතා සතුටු වෙමි. මා මේ ආකාරයෙන් ලියා ඔබ හා සමග බෙදා ගන්නා වූ කාරණාවන් ඔබව ධෛර්යමත් කර ඉදිරියට ගෙනයයි කියා මා විශ්වාස කරමි. ඔබ ගමන් කරන්නා වූ තත්ත්වය කුමනාකාරව තිබුණත් මට උපකාර කරන දෙවියන් වහන්සේ ඔබ සමග ද සිටිමින් සැබැවින්ම ඔබට උදව් උපකාර කරයි. අප එකිනෙකාව ධෛර්යමත් කරමින් ජයග්‍රාහී මාවතෙහි ඉදිරියටම ගමන් කරමු.

**උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුන සේක !**

මෙම පදය කොතරම් බලවත් ප්‍රකාශයක්ද? කිතුණු ඇදහිල්ලේ අත්තිවාරම මෙම පදයයි. මළවුන්ගෙන් නැගිටුනා වූ ක්‍රිස්තුස්වහන්සේගේ බලය ගැන අප මෙනෙහි කරන විට ඔබ ගමන් කරන තත්ත්වය තුළ දෙවියන්වහන්සේ කතා කරයි කියා විශ්වාස කරමි.

මහා සිකුරාදා සහ පාස්කු ඉරිදා මිනිස් ඉතිහාසයේද විද්‍යාත්මකවද හා ආත්මික ලෙසද බලවත් බලපෑමක් ඇති කළ දවස්ය.

නමුත් අපගේ සිතුවිලි වලින් උපයෙව ඇත. මහා සිකුරාදා අපගේ හදවත කැඩුණු නමුත් ඉරිදින අපගේ හදවත ඔසවනු ලැබුවා. නමුත් සෙනසුරාදා දින අපට නිහඬ කාලයක්ව තිබුණි.

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

**Christian YouTube Channel!**

Every day morning 2 minutes message by

**Pr. S. Sam Selva Raj!**

in English, Hindi, Tamil & Telugu

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please subscribe if you are blessed!

Share with whom you love & care!!

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...





### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

**EDITOR, PUBLISHER & PRINTER**



Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call


"...උන්වහන්සේගේ ආත්මය ඊශ්‍රායල්ගේ කාලකන්නිකම ශෝක වූනේය."

- Judgs 10:16.

ප්‍රිය මිතුවරුනි,

අපගේ දෙවියන්වහන්සේ යහපත්ය. උන්වහන්සේ සදාකාලයටම ජීවමානය. ඔබගේ ජීවිතයේ අලුත් දෙයක් කරන පිණිස උන්වහන්සේගේ මාර්ගයෙහි ඔබව ගෙනයන සේක. ඔබගේ ජීවිත ගමන් මාර්ගයේදී ඔබ පැකිලෙන විට උන්වහන්සේගේ දෑත් ඔබ වෙත දිගු කර උන්වහන්සේ ඔබව උසුලන සේක. ඔබ ගමන් කලා වූ සෑම වේදනාකාරී අත්දැකීමක් තුළින්ම දෙවියන්වහන්සේ ඔබට මතක් කර දෙන්නේ උන්වහන්සේගේ හදවත ඔබ කෙරෙහි ක්‍රියා කරන බවයි. එම නිසා ධෛර්යමත් වන්න. ඔබගේ මිදීමේ දවස ළං වන සේක!

*"ඊශ්‍රායෙල් පුත්‍රයෝ නැවතත් ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුන දේ කොට බාල්දේවතාවුන්ටත් අෂ්ටාරොතට්ත් සිරියේ දෙවිවරුන්ටත් ශීදොන්හි දෙවිවරුන්ටත් මෝවබ්හි දෙවිවරුන්ටත් අම්මොන් පුත්‍රයන්ගේ දෙවිවරුන්ටත් පිලිස්තිවරුන්ගේ දෙවිවරුන්ටත් සේවය කළෝය. ස්වාමීන් වහන්සේට සේවය නොකොට උන්වහන්සේ අත්හැරියෝය. (විනිශ්චයකාරයන්ගේ පොත 10:6)*

ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේව අත්හැර අන් දෙවිවරු පස්සේ ගිය නිසා ස්වාමීන්වහන්සේ ඔවුන්ගෙන් ඈත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඊශ්‍රායල් සෙනඟගේ සතුරන් ඔවුන්ට පහර දෙමින් ඔවුන්ට විරුද්ධව සටන් කළේය. එවිට ඊශ්‍රායෙල් සෙනඟ ඔවුන්ගේ පාපය ඒත්තු ගෙන මුළු හදවතින්ම දෙවියන් වහන්සේ වෙතට නැවත හැරුන නිසා ස්වාමීන්වහන්සේ ඔවුන්ට නැවත වාරයක් අනුකම්පා කර ඔවුන්ව මුදා හැරියේය. නැවත ඔවුන් උන්වහන්සේගේ ජයග්‍රහණය හා සමාදානය අත්දැක්කේය.

*"තවද අම්මොන් පුත්‍රයෝ යුදාටත් බෙන්යමින්ටත් එප්‍රායිම් වංශයටත් විරුද්ධව යුද්ධ කරන පිණිස යොර්දානෙන් මෙගොඩට ආවෝය. මෙසේ ඊශ්‍රායෙල් තද අමාරුවට පැමිණියේය. එවිට ඊශ්‍රායෙල් පුත්‍රයෝ ස්වාමීන් වහන්සේට මොරගසා: අපි අපේ දෙවියන්වහන්සේ අත්හැර බාල්දේවතා වුන්ට සේවය කිරීමෙන් ඔබවහන්සේට විරුද්ධව පව්කළෙමු යයි කීවෝය." (විනිශ්චයකාරයන්ගේ පොත 10:9-10)*

ඊශ්‍රායෙල් සෙනඟගේ මොරගැසීම ඇසූ කල්හි දෙවියන් වහන්සේ ඔවුන්ව සතුරා අතින් මුදනු ලැබුවේය.

*'එවිට ඔව්හු තමුන් අතරින් අන් දෙවිවරුන් පහකර දමා ස්වාමීන්වහන්සේට සේවයකළෝය. උන්වහන්සේගේ ආත්මය ඊශ්‍රායෙල්ගේ කාලකන්නිකම ගැන ශෝකවූයේය." (විනිශ්චයකාරයින්ගේ පොත 10:16)*

ඔබගේ වේදනාව ඔබ පමණක් දරා නොගන්න. ඔබ අත්දකින වේදනාවේ හැඟීම් උන්වහන්සේ සමඟ බෙදා ගන්න. කිසි විටෙක ඔබගේ සාමකාමී ජීවිතය තේරුම් ගැනීමට බැරි නමුත් උන්වහන්සේ ඔබව සම්පූර්ණයෙන්ම තේරුම් ගන්නේය. ධෛර්යමත්


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development



*Nehemiah Bible College students with Senior Pastor Sreekumar (Alumni)*

වන්න. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ බලවත් හාස්කමක් කරන සේක.

දෙවියන්වහන්සේගේ මහත් කරුණාවෙන් නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සේවාවන් ඉතා හොඳින් ක්‍රියාත්මක වෙයි. උන්වහන්සේ විශ්වාසවන්තව යටහත්කමෙන් මග පෙන්න නිසා අප උන්වහන්සේට ස්තුතිවන්ත වෙමු.



***Special retreat of our Nehemiah Bible College students at Mahapalipuram***

අපගේ බයිබල් විද්‍යාලයට NATA ආයතනයේ පිළිගැනීම ලැබී තිබේ. මෙය ලබා ගැනීම අපගේ බලවත් ජයග්‍රහණයකි. අපගේ බයිබල් විද්‍යාලය තවත් උසස් ස්ථානයකට ගමන් කරමින් සිටිමු,

එසේම අප දේවධර්ම ශාස්ත්‍ර පිළිබඳ පාඨමාලාව ද පවත්වාගෙන යනු ලබමු, මෙම පාඨමාලාව කරගෙන තවත් වැඩිදුර ඉගෙන ගැනීමට, ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත්ව තිබේ.

ජනවාරි මස 24 වන දින සෑම ශිෂ්‍යයින්ම මහාබලිපුරම් යන ස්ථානයේ එකමුතුවක් සහ සහභාගිත්වයක් පැවැත්වූයෙමු, මෙහිදී සැමදෙනම ආරාධිත දේවගැති තුමා දේව වචනය බෙදාගත්තා ලදී. අපගේ ශිෂ්‍යයින් දේවාශීර්වාදය ලබා ගත් අතර ඉතා හොඳ සහභාගීත්වයක් තිබුණි.

අප ඔබගෙන් ඉතා යටහත් පහත්ව ඉල්ලන්නේ, මෙම බයිබල් විද්‍යාලය ගැන යාච්ඤා කරන්න කියාය. ඉදිරියේදී පැමිණෙනට තිබෙන්නා වූ වසරක් තුලදී බලවත් දේ සිදුවන පිණිස යාච්ඤා කරන්න. මෙම බයිබල් විද්‍යාලය දෙවියන්වහන්සේ උදෙසා බබළන්න කියද යාච්ඤා කරන්න.

*In Christ Jesus, your servant,*

***Pr. S. Sam Selva Raj***

E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

ඒ දිනයේදී කිසිවක් සිදු නොවුවාද කියා අප සිතුවට එදින නිහඬව බොහෝ දේ සිදුවිය. ඒ දවස නිහඬය කියා ලෝකයා සිතුවත් ස්වර්ග රාජ්‍ය තුළ එය ක්‍රියාකාරී දවසකි.

## 1). සෙනසුරාදා දවස අපට තේරුම් ගත නොහැකිය

යේසුස්වහන්සේ ඉතා පැහැදිලි ලෙස පවසනු ලැබුවේ; *"තුන් දවසකට පසු මා නැවත නැගිටින බවයි." (මාර්ක් 8:31)* සිකුරාදා දින සිදු වූ වේදනාකාරී තත්ත්වය නිසා දෙවියන්වහන්සේගේ පොරොන්දු ගැන කම්පාවක් ඇති කළේය:

සෙනසුරාදා දිනයේදී

දෙවියන් වහන්සේ නැගරී සිටියා කියා සිතූ දවසයි.

යාච්ඤාවට පිළිතුරු නොලැබුණයි කියා සිතූ දවසයි.

ඇදහිල්ල දුර්වල වූ දවසයි.

ගෝලයින් යේසුස් වහන්සේ මැරුණාය කියා කැලඹිල්ලට පත්විය. ඔවුන්ගේ බලාපොරොත්තු, දර්ශනය හා ඇදහිල්ල නැතුව ගියෝය. ඒවා උන්වහන්සේ සමගම සමාදාන කාලයක්ය කියා සිතුවෝය. අපගේ ස්වාමියාට මෙසේ සිදුවුවා නම්; අපට කුමක් සිදු වේද? කියා ඔවුන් සිතුවෝය. සෙනසුරාදා උදාසන වේදනාව, දුක, බිය සහ කැලඹිල්ලෙන් සිත් කැඩීමෙන් ඔවුන් දොරවල් වසාගෙන සිටියෝය.

අප අතර සිටින බොහෝ අයත් මේ සෙනසුරාදා දිනය මෙන් මේ ලෝකයෙන් තමාව වෙන්කර තනිව සිටී. මෙම පණිවිඩය ඔබටයි!

යේසුස්වහන්සේ වසා තිබුනාවූ කාමරයට ඇතුල් වෙමින් සමාදානය වේවා! කියා පැවසුවේය. ඔබත් සෙනසුරාදා දිනය මෙන් නිහඬව සිටිනවා නම්, දෙවියන්වහන්සේ ඔබට දෙන අනාවැකිය නම්; සමාදානයයි.

*"…. යුදෙව්වරුන්ට භයින් දොරවල් වසා තිබෙද්දී ගෝලයන් එක්ව සිටි තැනෙහි යේසුස් වහන්සේ ඇවිත් මැද සිට තුඹලාට සමාදානය වේවා කියා ඔවුන්ට කී සේක." (යොහාන් 20:19)*



**Jesus said 'Peace be with you'**

යෝසෙප් දෙවියන් වහන්සේගෙන් සිහින ලබායත් නමුත් ඔහු පාළු ළිඳක සිටියේය. ඉන්පසු සිර ගෙදර සිටියේය. කිසිම සැබෑ නැත. කිසිම පැහැදිලි කමක් නැත. නමුත් ඔහුගේ ජීවිතයෙහි දෙවියන් වහන්සේගේ අරමුණ ඉෂ්ට කරන පිණිස උන්වහන්සේ ඔහු වෙනුවෙන් නිහඬව ක්‍රියා කළේය.



*After silence of God, miracle happened!*

රතු මුහුද ඉදිරියෙහි ඊශ්‍රායෙල් සෙනඟ සිටගෙන සිටියදී ඵාරාවෝගේ සමුද්‍රාව ඔවුන් පසුපස ලුහුබැඳ එන විට දෙපැත්තෙන් කන්දක් මෙන් රතු මුහුදේ වතුර බෙදී ගියේය.

*“භයනොවෙල්ලා, නිශ්චලව සිට ස්වාමීන් වහන්සේ අද නුඹලාට සිදු කර දෙන ගැලවීම බලාපල්ලා. මක්නිසාද නුඹලා අද දුටු මිසරවරුන් නැවත කවදාවත් නොදක්නහුය. ස්වාමීන් වහන්සේ නුඹලා උදෙසා සටන්කරනසේක. නුඹලා නිශ්ශබ්දව සිටිය යුතුයැයි සෙනඟටකීවේය.” (නික්මයාම 14:13-14)*

සෙනසුරාදා දිනය අපට මතක් කර දෙන්නේ දෙවියන් වහන්සේගේ නිහඬතාවය යනු අපව අත්හැරියා කියන එක නොවේය.

## 2). අඳුරේදී දෙවියන් වහන්සේ ඉතා ගැඹුරු ක්‍රියාවක් කරයි.

අපට කිසිවක් නොපෙනෙන අවස්ථාවේදී උන්වහන්සේ ඉතා බලවත් ලෙස ක්‍රියාත්මක වනු ලබයි.



*God's Creations*

*“පටන් ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. පොළව වනාහි පාළුව හිස්ව තිබුණාය. ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජල මතුයෙහි හැසිරෙමින් සිටි සේක.” (උත්පත්ති 1:1-2)*

සෑම දේම අන්ධකාරයෙන් වැසී තිබූ වේලාවේදී දෙවියන් වහන්සේගේ ආත්මය හැසිරෙමින් සිටියේය. කිසිවක් නොපෙනෙන අවස්ථාවේදී දෙවියන් වහන්සේගේ ආත්මය ක්‍රියාත්මක වෙමින් තිබුණි.

අපගේ යාච්ඤාවට පිළිතුරු නොලැබුණායි කියා සිතන විටදීත්

ඔබට ලැබෙන්න ඕන දේ ප්‍රමාද වන විටදීත්

ඔබගේ හදවතෙහි බලාපොරොත්තු නැතිව සිටින විටදීත්

දෙවියන්වහන්සේ නිරය පිටුපස සිට ඔබ වෙනුවෙන් ක්‍රියා කරනු ඇත.

යේසුයන් සෙනසුරාදා දින දී නිහඬව සිටිමුත් යේසුස් වහන්සේ ක්‍රියාත්මක නොවී නොසිටියේය. දේව වචනය මෙසේ පවසයි.

*උන්වහන්සේ පොළොවේ පහත් තැන්වලට බැස්සේය. (එපීස 4:9)*

*අධිපතීන්ද බලය ලත්දන්ද පහ කළේය. (කොලොස්සි 12:15)*

*මරණයේ ද පාතාලයේ ද යතුරු උන්වහන්සේ අතට ගත්තේය. (එළිදරව් 1:18)*

ලෝකයා දුටුවේ සෙනසුරාදා දින නිහඬතාවයයි. නමුත් ස්වර්ගය දුටුවේ ජයග්‍රහණයයි. දෙවියන් වහන්සේ ඔබ ගැන නිහඬව සිටිනවාය කියා ඔබ සිතන නමුත් උන්වහන්සේ ඔබගේ අඳුරුතම මොහොතේදී ඔබ ජයග්‍රහණය ලබන පිණිස ක්‍රියා කරමින් සිටී. ඔබව ජයග්‍රාහී ඉරු දිනක් උන්වහන්සේ සූදානම් කරමින් සිටී. එබැවින් කළ නොකිරෙන්න. ප්‍රිය සහෝදරය සහෝදරිය, නිහඬතාවයත් අඳුරත් දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් කිසි දෙයක් නොකරනවාය කියා තේරුම් නොකරයි.

යෝනා දින තුනක් මාළුවාගේ බඩ තුළ අඳුරෙහි සිටියේය. ඔහුට එය දඬුවමක් කියා හැඟුණි. නමුත් දෙවියන්වහන්සේ එය ඔහුව සූදානම් කළ කාලයයි. දෙවියන් වහන්සේ ඔහුව මහත් වූ සේවයකට සූදානම් කළේය. දානියෙල් සිංහ ගුහාවක නිහඬ රාත්‍රියක් ගත කළේය. නමුත් දෙවියන් වහන්සේ සිංහයාගේ මුඛයන් වසා දමන පිණිස ඉතා කාර්යබහුලව සිටියේය. (දානියෙල් 6:22)

දෙවියන් වහන්සේ සියලුම මුඛයන් වසයි. ඔබට විරුද්ධව නැගිටින සෑම පැලැස්මක්ම සියලු රීතලයක්ම

....Contd. to page 6





ඉතා හදිසි දැනුම් දීමක්!

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1960

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අප්‍රේ:19** - අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති එස්.සෑම් සෙල්ව රාජ් ගේ මිනිත්තු 5 U Tube හරහා බෙදාගත් සාක්ෂි නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:20**- අපගේ සියලුම සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:21** - අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, මහා ආඥාවේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් කෙරෙහි දෙවියන්වහන්සේගේ කරුණාව තබා තිබූ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:22**- අපගේ සභාවේ ඉරුදින පාසල, කරුණා සේවය සහ රෝහල් සේවයට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:23** - අපගේ බයිබල් පාඨමාලා (තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව ) සහ අපගේ දේවධර්ම ලිපි හුවමාරු පාඨමාලා කෙරෙහි දෙවියන් වහන්සේගේ අඛණ්ඩ ආශිර්වාදය නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:24**- අපගේ සංවිධානයට කැපවූ සහ සුදුසුකම්ලත් නව අපේක්ෂකයන් බඳවා ගැනීමට හැකිවන පරිදි දෙවියන්වහන්සේගේ මගපෙන්වීම නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:25**- අපගේ සියලුම රාජ්‍ය සම්බන්ධිකාරවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබුණු නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:26**- අපගේ සේවකයන්ගේ නොසැලෙන කැපවීම නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:27**- අපගේ කැදවීමේ ප්‍රතිරාවය U Tube නාලිකාවට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබුණු නිසාත් ළඟා නොවූ විවිධ ජාතීන් වෙත ළඟා වීමට හැකි වූ නිසාත් ස්තුති කරන්න

**අප්‍රේ:28**- 2025 - 2026 මූල්‍ය වර්ෂය සඳහා දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා දුන් නිසා ස්තුති කරන්න

**අප්‍රේ:29** - අපගේ සභාවේ සියලු ක්‍රියාකාරකම් වලට ජ්වලිතව සහභාගී වීමට තරුණයන්ව පොළඹවමින් දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා දුන් නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:30**- ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ සිසුන්ට 10 වන ශ්‍රේණියේ විභාගය සාර්ථකව නිම කිරීමට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා දුන් නිසා ස්තුති කරන්න.

**මැයි:01**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති එස්. සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ අය සියලු නපුරු ආධිපත්‍යයන්ගෙන් දෙවියන්වහන්සේ ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**මැයි:02**- ශ්‍රී ලංකා දේශය තුළ බාධාවන් ඉවත්ව ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:03**- ශ්‍රී ලංකා දේශයට දෙවියන් වහන්සේ සමාදානය ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මැයි:04**- අපගේ සියලුම සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වල අය උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:05**- අපගේ සංවිධානයේ සියලුම සේවකයින් අතර එකමුතුකම ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:06**- 2026 - 2027 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නේවාසික සහ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යාලවලට සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මැයි:07**- 2026 - 2027 අධ්‍යයන වර්ෂය සඳහා ශාන්ත පාවුළු මධ්‍ය මහා විද්‍යාලයට නව සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මැයි:08**- අපගේ සියලුම සේවාවන් වලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:09**- අපගේ මුද්‍රණාලයට සහ එහි දෛනිකව සිදුවෙන්නාවූ කටයුතු වලට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:10**- අපගේ සියලුම සභාවන් ආත්ම දිනාගැනීමට සහ සැබෑ පුනර්ජීවනයක් අත්විදීමට හැකිවනන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:11** - අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය 2026 ජුලි 4වන දින පැවැත්වීමට නියමිතය යාච්ඤා කරන්න.

**මැයි:12**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති එස්. සෑම් සෙල්වා රාජ් සහ ඔහුගේ පවුලේ අය සියලු ආකාරයේ නපුරු බලවේග වලින් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:13** - අපගේ සියලු සේවාවන් සහ මිෂනාරිවරුන්ට එරෙහිව සිදුකරන ලද සියලු අපරාධ නවත්වන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:14**- ගෝලීය වශයෙන් පවතින අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේ දෙවියන්වහන්සේගේ දිව්‍ය ආරක්ෂාව ලොව පුරා පවතින පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:15**-- මෙම නව මූල්‍ය වර්ෂය පුරාම දෙවියන් වහන්සේගේ දිව්‍ය මගපෙන්වීම ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:16**-- ලෝකයේහි පවතින යුද්ධමය තත්ත්වයෙන් හමුවේ වේදනාවෙන් සිටින සියලුම ජනතාවගේ ගැලවීම හා ආරක්ෂාව පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:17**-- ලෝකයෙහි පවතින යුදමය සටන් ඉවත් වී දෙවියන් වහන්සේගේ සමාදානය සියලු මනුෂ්‍යයන් වෙත ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:18**-- ලෝකය තුළ පවතින යුදමය තත්ත්වය නිසා බොහෝ රටවල් ආර්ථිකමය ලෙස මුහුණ දෙනු ලබන ගැටලු වලට යහපත් විසඳුම් ලබාදෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

උන්වහන්සේ බල රහිත කරන පිණිස ඔබගේ අඳුරු වේලාවේදී උන්වහන්සේ ක්‍රියා කරමින් සිටියි.



***Daniel spent a silent night in the lions' den***

## 3). සෙනසුරාදා දිනය අපට උගන්වන්නේ සාක්ෂියක් නොමැතිව විශ්වාස කරන්න කියාය.

ඉරුදින ඇදහිල්ල සැමරීමය.
සෙනසුරාදා යටහත්කමය.
සෙනසුරාදා දිනයේ ඇදහිල්ලේ කියන්නේ:

"ඔබ දකින්නේ නැහැ, එහෙත් දෙවියන් වහන්සේ විශ්වාසවන්තයි."

"මට හැඟෙන්නේ නැහැ, නමුත් දෙවියන් වහන්සේ වහන්සේගේ පොරොන්දුව ස්ථිරයි."

"මට තේරුම් ගන්න බැහැ, එහෙත් ස්වාමීන් වහන්සේ යහපත්ය."

ආබ්‍රහම් ඊසාක්ව ලැබෙන තුරු බලාපොරොත්තුවෙන් සිටියේය. දෙවියන් වහන්සේ ඔහුට පුත්‍රයෙක් දීමට පොරොන්දු වූයේය. වසර ගණනාවක් නිහඬ කාලයක් තිබුණි. රෝම 4:19-20 හි මෙසේ පවසයි. "*.......ඔහු ඇදහිල්ලෙ ගැන චංචල නොවී සිටියේය......*" සෙනසුරාදා දිනය අප අත්දකින කාලයේ අපව චංචල නොවන්නා වූ ඇදහිල්ල කෙරෙහි ගොඩ නගයි. මෙලෙස චංචල නොවී ගොඩනැගීමට එදා ආබ්‍රහම්ට ඉතා පහසු වූවායැයි කියා නොසිතන්න. ශාරීරික ලෙස එය ඉතාම අමාරු දෙයකි. මිනිසුන් ඔහුගෙන් මෙසේ අසන්නට ඇත: "දෙවියන්වහන්සේ සැබවින්ම මෙය ඔබට දුන් පොරොන්දුවක්ද කියා සිතුවාද? නැතිනම් ඔබගේ හදවත තුළින්ම පැමිණි දෙයක්ද?" සෑම දිනකදීම ඔහු සාරාව දුටු කල්හි ඔහුගේ හදවත කැලඹෙන්නට ඇත. නමුත් ඔහු දෙවියන්වහන්සේගේ පොරොන්දුව විශ්වාස කරමින් සිටියේය.

ඔබ දකින දේ තුළින් ඔබගේ ඇදහිල්ල සැලෙන්නට ඉඩ නොදෙන්න. ඔබගේ මාංශික ඇස්වලින් දකින සාරාව ඔබගේ ආත්මික ඇස්වලින් දකින්න. පොරොන්දුව දුන් දෙවියන්වහන්සේ එය ඉටු කරන දෙවියන් වහන්සේය. එබැවින් ආබ්‍රහම්ගේ සෙනසුරාදා දින හාස්කමකින් නිමා වූයේය. ලෝකයේ ඉතිහාසය වෙනස් කරනු ලැබුවේය.

ප්‍රිය මිතුවරුනි, සාක්ෂි සහ ලකුණු නොසොයන්න. දෙවියන් වහන්සේව විශ්වාස කරන්න. උන්වහන්සේව තදින් අල්ලා ගන්න. ඔබට තිබෙන සෙනසුරාදා අත්දැකීම හාස්කමකින් නිමා වෙනවා ඇත. සෙනසුරාදා අත්දැකීම ගැඹුරට මුල් ඇද ඔබව ඇදහිල්ලෙන් වර්ධනය කරනු ඇත.

## 4). සෙනසුරාදා දින මළවුන්ගෙන් නැගිටීමට අපිව සූදානම් කරන දිනයයි.

සෙනසුරාදා දිනය අප සූදානම් වීමේ දවසය කියා බොහෝ දෙනා අමතක කර දමයි. එය ඉරුදින සිදුවන්නට යන මහත් වූ හාස්කමට සූදානම් වීමේ දවසයි. සෙනසුරාදා අපව ගැඹුරු ඇත්දැකීමකට ගෙන ගොස් අපව ශක්තිමත් කරමින් පවිත්‍ර කරමින් ඉදිරියට යාමට සලස්වයි.

*වයස අවුරුදු 17දී දාවිත්ව රජ කෙනෙක් ලෙස ආලේප කළේය. (1 සාමුවෙල් 16:16) නමුත් ඔහු රජකමට පත් වූයේ වයස අවුරුදු 30 දීය.* මෙය (1 සාමුවෙල් 5:4) හි සඳහන් කර ඇත.

මෙම වසර ගණනාවක් තුළ දෙවියන්වහන්සේ ඔහුව සූදානම් කරමින් ඔහුව හැඩගස්වමින් ඊශ්‍රායල්හි බලවත් රජෙක් ලෙස ක්‍රියා කිරීමට ඉගැන්නුවේය. දාවිත් මෙන් කිසිම රජ කෙනෙක් බල සම්පන්නව රජකම් කළේ නැත. ඔහු බලා සිටි කාලය තුළ ඔහුට යටහත්කමත් සමාව දීමත් ධෛර්යවන්තව ක්‍රියා කිරීමටත් නිර්භීතව යෝධයින්ට මුහුණ දීමටත් ඔහුගේ චරිතය වෙනස් වීමටත් හා ඉගෙන ගැනීමටත් පුහුණුවක් ලැබුවේය. මේ සෑම දේටම වඩා ඔහු ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වයෙහි සිටීමට ඉගෙන ගත්තේය.

*"ඔබ ඉදිරියෙන් මා බැහැර නොකළ මැනව; ඔබගේ ශුද්ධාත්මය මාගෙන් පහ නොකළ මැනව." (ගීතාවලිය 51:11)*

*"මක්නිසාද ඔබගේ මණ්ඩප වල එක දවසක් දවස් දහසකට වඩා යහපත දුෂ්ටකමේ කූඩාරම් වල විසීමට වඩා මාගේ දෙවියන්වහන්සේගේ ගෘහයෙහි දොරටු පාලයෙක්ව ඉන්ට කැමැත්තෙමි." (ගීතාවලිය 84:10)*

ඔබ කිසියම් දෙයක් ගැන බලා සිටිනවාද? එසේ නම් ඔබට දෙවියන් වහන්සේ මහත් දේවල් කරන පිණිස බව ඔබ තේරුම් ගන්න.

ධෛර්යමත්ව උන්වහන්සේ තුළ ශක්තිමත් වන්න!

## 5). ඔබගේ සෙනසුරාදා දිනය සදහටම පවතින්නේ නැත!

දෙවියන්වහන්සේ ඔබට මළවුන්ගෙන් නැගිටුනාවූ බලවත් ඉරු දිනක් තබා තිබෙන ආකාරයට අඳුරු සෙනසුරාදා දිනය සදහටම ඔබට තිබෙන්නේ නැත.

නිහඬ සෙනසුරාදා දිනය තාවකාලිකය
සෙනසුරාදා දුක තාවකාලිකය.
සෙනසුරාදා කැලඹීම තාවකාලිකයි.



*'Destroy this temple, and in three days I will raise it up.'*

යේසුස්වහන්සේ මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේය; *"......මේ මාළිගාව කඩා දමාපල්ලා. එවිට තුන් දවසකින් එය නැගිටුවන්නෙමි." කී සේක. (යොහාන් 2:19)*

ඔබගේ මාර්ගය බාධා කරමින් තිබෙන්නා වූ ඒ බලවත් ගල පෙරළී යයි. ඔබගේ සෙනසුරාදා දිනයට ආලෝකයක් පැමිණෙයි. දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඔබට ඉෂ්ට වෙයි. ඔබ සොහොනෙන් එළියට පැමිණ ජීවමානව ඇවිදියි. ඔබගේ ජීවිතයේ සෙනසුරාදා දිනයක් තිබේ නම්, සැබැවින්ම ඉරුදිනක්ද උදාවෙයි.

ලාසරස් ගැන මා සිතන විට ඔහුව සොහොනේ තැන්පත් කර දින හතරක් ගතවිය. එය දින හතරක නිහඬ තාවයක් වුවත් සැම දේම අවසන්ය කියා සිතුවත් යේසුස් වහන්සේ පැමිණි විට සෑම දේම වෙනස් විය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක;

*''නුඹ විශ්වාස කළොත් දෙවියන් වහන්සේගේ මහිමය දකින්නෙහිය....." (යොහාන් 11:40)*

ප්‍රිය මිතුවරුනි , මගේ ජීවිතයේත් බොහෝ සෙනසුරාදා දිනයන් අඳුරු කාලයන් තිබුණි. මා ඔබට කතා කරන දේ ගැන මා හොඳින් දනිමි. එම අත්දැකීම් කොතරම් හදවත බිඳෙන භයානකද අත්දැකීම්ද කියා මා දනිමි. එවැනි කාල වලදී මගේ බලාපොරොත්තුව මා සම්පූර්ණයෙන් අත්හැරියෙමි. නමුත් එම කාලයේදී යේසුස් වහන්සේ මගේ ජීවිතයට ඇතුළු වෙමින් එම සියලුම දේට හිතක් තැබුවේය. මගේ ජීවිතය තුළ උන්වහන්සේට එම දේ කිරීමට පුළුවන් වූවානම් ඔබගේ ජීවිතයේත් එම දේ කිරීමට පුළුවන. ඔබගේ ජීවිතයේ තිබෙන ලැජ්ජාව, පරාජය වේදනාව හා අනෙකුත් සියලුම දේ ඉක්මනින් නිමා වීමට යයි. ඔබට තිබෙන සෙනසුරාදා දිනය ඔබට තිබෙන අවසානය නොවෙයි.

යේසුස්වහන්සේ මෙලොවට පැමිණුනේ අපගේ ජීවිතයට බලාපොරොත්තුවක් අරමුණක් හා අර්ථයක් ගෙන දෙන පිණිසයි. අප පාපයෙන් හා පරාජයෙන් ජීවත්වීම දේව කැමැත්ත නොවේ. උන්වහන්සේ මෙලොවට පැමිණියේ කුරුසියේ ජීවිතේ පූජා කරමින් තුන්වන දින මළවුන්ගෙන් ජයග්‍රාහීකව නැගිටනු ලැබ අපටද ජයග්‍රාහී ජීවිතයක් ගත කරන පිණිසයි. අප තවමත් වහල්කම තුළ නොව අප ජයග්‍රහණය තුළ ජයග්‍රාහකයෝය.

ඔබගේ ජීවිතයේද ඔබ මෙම සෙනසුරාදා අත්දැකීම් තුළ යනවා නම් ධෛර්යමත් වෙන්න. නිහඬ සෙනසුරාදා දවස ජයග්‍රාහී ඉරුදිනකට හැරෙයි. දෙවියන් වහන්සේ දැන් ඔබගේ ජීවිතය තුළ ක්‍රියාකරයි.

සෙනසුරාදා දින නිහඬතාවයට වඩා ඉරුදින ලැබෙන්නා වූ මළවුන්ගෙන් නැගිටීම මහත්ය. දෙවියන් වහන්සේව තදින් අල්ලා ගන්න. උන්වහන්සේගේ පොරොන්දු වලට ඇලුම් වෙන්න. ඔබගේ ඉරුදින දවස ඔබට පැමිණෙයි. උන්වහන්සේව විශ්වාස කරන්න. ඔබගේ සෙනසුරාදා නිහඬතාවය ජයග්‍රාහී ඉරු දිනට හැරවිය හැකි වන්නේ උන්වහන්සේට පමණි. දෙවියන්වහන්සේ අප වෙනුවෙන් පැමිණෙන රජතුමාය.

★ දෙවියන්වහන්සේ වහන්සේ නිහඬ වීමට පුළුවන් නමුත් උන්වහන්සේ සැම සැමදාම නිහඬ නැත.

★ උන්වහන්සේ සැඟවී සිටින නමුත් උන්වහන්සේ නොපැමිණෙන්නේ නැත.

★ උන්වහන්සේ නිහඬව සිටින්නට පුළුවන් නමුත් උන්වහන්සේ සැම විටම විශ්වාසවන්තය.

*************

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for Admission!
Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### “...කියවන්නා තේරුම් ගනීවා....” (මතෙව් 24:15)

**දෙවියන්වහන්සේගේ කැඳවීමට ඔබ විශ්වාසවන්තව සිටියි කියා උන්වහන්සේ බලාපොරොත්තු වෙයි !**

*''ස්වකීය පුත්‍ර වූ අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සහභාගිකමට නුඹලා කැඳවාගත් දෙවියන් වහන්සේ විශ්වාසව සිටින සේක.'' (1 කොරින්ති 1:9)*



1969 වන වසරේ දී මා යේසුස් වහන්සේව මගේ පුද්ගලික ගැලවුම්කාරයා ලෙස පිළිගත්තෙමි. පසුව පාස්ටර් එස්. දේවදාසන් සමඟ පෙරමග දූතයා සඟරා සේවයට එකතු වුනෙමි. දෙවියන් වහන්සේට සේවය කරන පිණිස ඔහු මට ආත්මික ලෙස මග පෙන්වීමක් දුන්නේය. ඔහු යටතේ මා වසර තුනක් සේවයෙහි යෙදී සිටියෙමි.

එක්තරා රාත්‍රියකදී අප දෙදෙනා යාච්ඤා කරන විටදී එම දේව ගැතිතුමා ලෝකයේ අනාගතය කෙසේ තිබේද? කියාත් දෙවියන් වහන්සේ මා තුළින් කිරීමට බලාපොරොත්තු වන්නේ කුමක්ද? කියාත් බොහෝ පුදුමාකාර දේ මා ගැන කියන්නට පටන් ගත්තේය. ඔහු කියූ දේවල් ගැන ඔහුටවත් සිතා ගැනීමට බැරිවිය. මන්ද මට අධ්‍යාපන සුදුසුකම් හෝ මුදල් හෝ මනුෂ්‍ය බලයක් හෝ මහත් සේවයක් කිරීමට තරම් හැකියාවක්ද තිබුණේ නැත.

මා පාලකතුමාට මෙසේ පැවසුවෙමි;

''පාස්ටර් මම මේ විදිහට දෙවියන් වහන්සේට සේවය කිරීම මට හොඳයි.'' කියාය.

එවිට ඔහු මට මෙසේ පවසනු ලැබුවේය:

''සාමාන්‍ය මනුෂ්‍යයෙකුව බලවත් දේව දාසයෙක් කිරීමට කරුණු දෙකක් අවශ්‍යයි. එනම්;

**a**). ඇඳහිල්ල

**b**). යහපත් හෘද සාක්ෂිය

1 තිමෝති 1:19 හි පවසා ඇති පරිදි;



''ඔබගේ ඇස සෑම තැනුරෙන්ම ආරක්ෂා කරගන්න. ඔබට සෑම උසස් වීමකම මා හී පරිදි ඉටුවෙයි'' කියා පැවසුවේය.

දෙවියන්වහන්සේ මට උපකාර කළේය. මා මේ දෙය ආරක්ෂා කිරීමට පසුගිය වසර ගණනාවක් මුළුල්ලේම ක්‍රියා කළෙමි.

මෙම සඟරාව ලිවීමට පෙර දෙවියන් වහන්සේ මට කතාකර පැවසූ දෙයට මා පුදුමයට පත්විය. උන්වහන්සේ මට කතා කරමින් පවසනු ලැබුවේ;

''මාගේ පුත්‍රය, ඔබ අද සිටගෙන සිටින මේ ගොඩනැගිල්ල ඔබට ලැබුණේ කෙසේද? ඔබගේ සේවය දෙස බලන්න. ශුභාරංචි පත්‍රිකා මුද්‍රණය කරන මුද්‍රණාලය දෙස බලන්න. ඔබට ලැබී තිබෙන සියලු තාක්ෂණ යන්ත්‍ර දෙස බලන්න. පැය 24 පුරාම නොකඩවාම පවත්වාගෙන යන්නා වූ යාච්ඤා සේවය දෙස බලන්න. නෙහෙමියා බයිබල් විද්‍යාල හා එම සේවය ගැනත් එහි ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගැනත් බලන්න. කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්යාල සේවය ගැන බලන්න.''

''ඔබට තිබෙන හැකියාවට වඩා ඔබ අද සාර්ථකව ඇති බව බලන්න. අද ඔබව දරාගන්න පිණිස ඔබට දී තිබෙන ආරොන්ලා සහ යෝෂුවාලා දෙස බලන්න. සෑම අවස්ථාවකම ඔබට උපකාර කිරීමට සිටින අය දෙසද බලන්න. ඔබට දී තිබෙන මේ සියලු ආශිර්වාදයන් දෙස බලන්න. මා ඔබව සිහි කරනවා. මා ඔබට ප්‍රථමයෙන් කතා කළ දවසේදී ඔබ සිටියේ කොහේද? අද ඔබ සිටින තත්ත්වය දෙස බලන්න. ඔබගේ සේවය තවත් මම විශාල

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

කරමි. මගේ දේව දාසයා පැවසූ දේට ස්ථිරව සිටින්න. ස්ථිර ඇදහිල්ලෙන් හා යහපත් හෘද සාක්ෂියක් ඇතිව සිටින්න. අධෛර්යමත් වන්නට එපා. ඔබ ඉතා අමාරු මාර්ගත් තුළින් ගමන් කරන විටදී මා ඔබට කැඳවූ බව අමතක නොකරන්න. මගේ මුඛයෙන් ප්‍රකාශ කළ සියලුම දේ මා ඔබ වෙනුවෙන් ඉෂ්ට කරන්නෙමි. ධෛර්යමත් වෙන්න" කියා පැවසුවේය.

සමහර අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේ මා තුළින් කළ මහත් දේවල් මට පෙනුනේ නැත. නමුත් මා දෙවියන් වහන්සේව විශ්වාස කළෙමි.



ප්‍රිය සහෝදරයා සහෝදරිය,

ඔබට ඉහළින් තබා තිබෙන නායකයින්ට කීකරු වෙන්න. ලෝකයේ ආකාරයට ගමන් නොකරන්න. දෙවියන් වහන්සේ ඔබට දී තිබෙන නායකයින් යටතේ යටහත් පහත්ව සිටින්න. ඔබගේ

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

ඇදහිල්ලත් යහපත් හෘද සාක්ෂියත් රැකගන්න. දෙවියන් වහන්සේ ඉදිරියෙහි අවංකව සිටින්න. ඔබ තුළින් දෙවියන් වහන්සේ මහත් දේ කරයි. ඔබවත් බලවත් ලෙස පාවිච්චි කරනු ලැබීමට කිසිවෙකට්වත් බාධා කිරීමට නුපුළුවන. දෙවියන්වහන්සේට සියලු ගෞරවය හා මහිමය වේවා!

************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

**Kind Attention**

**Please Pray for**

Kindly join with us for our **Nehemiah Bible Colleges Graduation Ceremony** which will be held at 5.00 P.M. on 4th July 2026 (Saturday) at BALAR KALVI NILAYAM, Chennai-7.

**Special Guest:**

**REV. DR. S.J. KINGSLEY,**

**(COO, JESUS CALLS)**

We request applications from dedicated students to our College for the next academic year 2026-2027 which will begin from 1st June 2026.

- Principal

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd APRIL 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**